# ප්‍රසම්පාදන දැන්වීමයි

## ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව - මොරහැල, බලන්ගොඩ

පහත සඳහන් පහත වැඩ විෂයන් සඳහා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටු සභාපති වන මා විසින් සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද මිළ ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | වැඩ විෂයය | ලියා පදිංචි ශ්‍රේණිය/ක්ෂේත්‍රය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු (රු) | ආපසු ගෙවනු ලබන ලංසු බැඳුම්කර (රු) | කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුගත වටිනාකම (රු.මි) |
|---|---|---|---|---|---|
| 01 | පින්නවල වීරක්කොඩි ඇළ අසළ මාර්ගය | C9,C8,C7<br>මහාමාර්ග | 1,500.00 | 28,000.00 | 2.77 |
| 02 | මාරතැන්න එල්.ජී.පී. කොටසේ වැසිකිළි ඒකක 5ක් ඉදිකිරීම | C9,C8,C7<br>ගොඩනැගිලි | 1,500.00 | 21,500.00 | 2.11 |
| 03 | වැඩිහිටි නිවාසය මාර්ගය | C9,C8,C7<br>මහාමාර්ග | 1,000.00 | 20,000.00 | 1.98 |
| 04 | හේනමුල්ල මාර්ගය | C9,C8,C7<br>මහාමාර්ග | 1,000.00 | 20,000.00 | 1.98 |
| 05 | පිටදෙණිය මංසන්ධියේ සිට පඹදෙණිය හරහා පොල්වත්ත මාර්ගය | C9,C8,C7<br>මහාමාර්ග | 1,000.00 | 20,000.00 | 1.98 |
| 06 | මොරහැල පන්සල අසලින් වීදාගම දක්වා දිවෙන ගොඩපාර | C9,C8,C7<br>මහාමාර්ග | 1,000.00 | 20,000.00 | 1.98 |

**02.** මෙම ලංසු කැඳවීම ජාතික තරඟකාරී ක්‍රියාපටිපාටිය යටතේ සිදුකරනු ලබන අතර , මෙම කර්මාන්තයන්ට අදාල ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ **(CIDA)** ශ්‍රේණිගත ප්‍රමුඛතාවය හෝ සබරගමුව පළාත් ඉදිකිරීම් කොන්ත්‍රාත් ලියාපදිංචිය පදනම් කරගනිමින් ලංසුකරුවන් තෝරාගැනීම සිදු කරනු ලබයි.

03. ඉහත වැඩ විෂයට අදාළ ලංසුපත් **2026.10.08** වන දින සිට **2026.10.21** දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව **9.00.**සිට ප.ව **3.00.** දක්වා ඉහත සඳහන් පරිදි ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට මුදලින් ගෙවා ලබාගත හැකිය.

**04.** සියලුම ලංසුකරුවන් මෙම කර්මාන්තය ඉදිරියෙන් සඳහන් ලංසු බැඳුම්කර වටිනාකමට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් **2026.10.22** දින සිට **2027.01.06** දක්වා වලංගු වන පරිදි ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් නියෝග කළ වහාම කොන්දේසි විරහිතව මුදල් බවට පත් කරවා ගත හැකි ( **Unconditional On demand Bank Guarantee)** බැංකු ඇපකරයක් සභාපති, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව ,මොරහැල නමින් හෝ ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මුදල් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිවල මුල් පිටපත, සෙසු ලංසු ලේඛනවල මුල්පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය. සියළුම ලංසු **2026.12.09** දින දක්වා වලංගු විය යුතුය.

05. ඉහත ඉදිකිරීම් පිළිබඳ විස්තර ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ කාර්යාල වේලාවන් තුළදී දැනගත හැකිය.( 0452287361 )

**06.**සාර්ථක ලංසුකරුවන්ට කොන්ත්‍රාත් පිරිනැමීම ඔවුන්ගේ ලියාපදිංචි වටිනාකමට සීමා වනු ඇත. ලංසුපත් සම්පූර්ණයෙන් හෝ භාගික වශයෙන් ප්‍රතික්ෂේප කිරීමේ හෝ භාර ගැනීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ. ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**07.** ලංසු පිටපත් දෙකකින් යුතුව **2026.10.22** වන දින පෙ.ව. **10.00** දක්වා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ තබන ලද ටෙන්ඩර් පෙට්ටියට ගෙනැවිත් භාර දීමෙන් හෝ ප්‍රසම්පාදන කමිටු සභාපති , ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව, මොරහැල, බලන්ගොඩ නමට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් ඉදිරිපත් කළ හැකිය. මුල් ලංසුපත හා පිටපත ලෙස නම් කර කවරවල බහා වෙන් වෙන්ව මුද්‍රා කර නැවත එකම කවරයක බහා මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතුය.

**08. 2026.10.22** වන දින පෙ.ව.**10.00** ට ලංසු භාර ගෙන අවසන් වූ වහාම ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේදී ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ඇත. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරු හෝ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

ඒ.එම්.එස්.ඒ. බණ්ඩාර,
ප්‍රසම්පාදන කමිටු සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව,
මොරහැල,
බලන්ගොඩ.
**2026.10.08** වන දින